# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2024 ජනවාරි මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2024. 01. 17 දින නිකුත් කරන ලදී)**

# යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව

**එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

අධ්‍යාපන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල :** රු. 48.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# **යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව**

එල්.ඩී.-ඕ. 46/2008

**එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සඳහා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව

අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, සන්නිවේදනය සහ තොරතුරු මාර්ගයෙන් සාමකාමී සංස්කෘතියක් ගොඩනැගීමට, දුප්පත්කම පිටු දැකීමට, තිරසාර සංවර්ධනයකට සහ අන්තර් සංස්කෘතික සංවාදයකට දායක වීමේ එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානයේ (මෙහි මින්මතු "යුනෙස්කෝ" යනුවෙන් සඳහන් කරනු ලබන) දර්ශනය පිළිගනිමින්, ශ්‍රී ලංකාව 1949 දී යුනෙස්කෝ හි සාමාජිකත්වය ලබාගෙන ඇති හෙයින් ද;

අදාළ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික සහ සිවිල් සංවිධාන ඇතුළු ජාතික රාජ්‍ය සහ යුනෙස්කෝ සංවිධානය අතර සම්බන්ධීකරණ නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීමට සහ යුනෙස්කෝ පරමාර්ථ වැඩිදියුණු කිරීමේ දී සහ යුනෙස්කෝ ප්‍රමුඛතා ආධාර කරගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී දායකත්වය ලබා දීමට ජාතික කොමිෂන් සභාවක් නිර්මාණය කිරීමට යුනෙස්කෝ ව්‍යවස්ථාවේ VII වන වගන්තියෙන් එක් එක් සාමාජිකයන්ට බලය පවරනු ලැබ ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය

1. මේ පනත 2024 අංක        දරන යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### **යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීම**

යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීම

2. (1) (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තියෙන් ඊට පවරා ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද, එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ පරමාර්ථ

3. කොමිෂන් සභාවේ පරමාර්ථ විය යුත්තේ -

(අ) (i) ශ්‍රී ලංකාව තුළ යුනෙස්කෝව විසින් අරමුදල් සපයන ලද හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සියල්ල මෙහෙයවීම සඳහා;

(ii) යුනෙස්කෝ විධායක මණ්ඩලයේ දී සහ යුනෙස්කෝ මහා සම්මේලනයේ දී යුනෙස්කෝහි සියලු තීරණ, මාර්ගෝපදේශ, සම්මුති සහ වෙනත් සාධන පත්‍ර සම්බන්ධයෙන් මූල පිරීම, සම අනුග්‍රහය දැක්වීම සහ අනුමත කිරීම සඳහා;

(iii) කිසිදු වෙනස්කමකින් තොරව ශ්‍රී ලාංකිකයන්ගේ යහපත සහතික කිරීමෙහි ලා උපකලාපීය, කලාපීය සහ ජාත්‍යන්තර යුනෙස්කෝ කටයුතුවල දී ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී සහභාගීත්වය සඳහා;

(iv) යුනෙස්කෝ කාර්යාල සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම සඳහා,

තනිව හෝ වෙනත් මණ්ඩල සමඟ සම සහයෝගීව වගකීම භාර ගැනීම;

(ආ) යුනෙස්කෝ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සමඟ, ශ්‍රී ලංකාව තුළ පවත්නා බුද්ධිමය, විද්‍යාත්මක, කලාත්මක හෝ පරිපාලන සම්පත් සහ හැකියාවන් ලබා ගනිමින් ඵලදායී ලෙස අදාළ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ පෞද්ගලික නියෝජ්‍යායතන, ආයතන, සංවිධාන සහ බුද්ධිමතුන් සහ ශ්‍රී ලාංකික ජනතාව සම්බන්ධ කිරීම;

(ඇ) යුනෙස්කෝ ව්‍යවස්ථාවේ II වන වගන්තියෙන් අපේක්ෂිත පරිදි ශ්‍රී ලංකාව වෙනුවෙන්-

(i) එක්සත් ජාතීන්ට අයත් රටවල සංවිධානවල සහ වෙනත් ජාත්‍යන්තර ආයතන සහ වැඩසටහන්වල සහාය ඇතිව භාරගෙන ඇති යුනෙස්කෝව වෙත පවරා දෙනු ලැබ ඇති කටයුතු සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී;

(ii) යුනෙස්කෝ හි පරමාර්ථ ඉෂ්ටකර ගැනීමේ අරමුණින් ජාත්‍යන්තර, කලාපීය සහ උපකලාපීය කටයුතු මෙහෙයවමින් යුනෙස්කෝවට අනුබද්ධිත මණ්ඩල සහ වෙනත් ජාත්‍යන්තර සංවිධාන සමඟ දෙපාර්ශවයට ම ඵලදායී යුනෙස්කෝ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම පිණිස,

ජාත්‍යන්තර සහයෝගීතාවය සහ හවුල්කාරීත්වය වර්ධනය කිරීම;

(ඇ) යුනෙස්කෝ මගින් සංවිධානය කරනු ලබන දේශීය, කලාපීය සහ ගෝලීය වැඩසටහන් හරහා අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, සන්නිවේදනය සහ තොරතුරු යන ක්ෂේත්‍රවලට අදාළව තොරතුරු හුවමාරු කරගැනීමේ පහසුකම් සැලැස්වීම සහ එවැනි ක්ෂේත්‍ර කෙරෙහි මහජන උනන්දුව ඇති කිරීමට තොරතුරු ව්‍යාප්ත කිරීම සඳහා තුලනායතනයක් ලෙස කටයුතු කිරීම;

(ඉ) යුනෙස්කෝ සම්මුති සහ වෙනත් ජාත්‍යන්තර සාධනපත්‍ර අනුමත කර ඉදිරියට කටයුතු කරගෙන යාම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත හඳුන්වා දීම;

(ඊ) යුනෙස්කෝ පද්ධතිය හරහා ශ්‍රී ලංකාවේ තාක්ෂණික සහාය සහ හැකියාවන් වර්ධනයට පහසුකම් සැලැස්වීම; සහ

(උ) යුනෙස්කෝ පදනමේ ප්‍රධාන ආධාරක වන අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, සන්නිවේදනය සහ තොරතුරු මාර්ගයෙන් යුනෙස්කෝ ක්‍රියාකරකම්වලට සහභාගී වෙමින් මනුෂ්‍ය වර්ගයාගේ සාමය, ආරක්ෂාව සහ පොදු සුබසාධනය පවත්වාගෙනයාමේ යුනෙස්කෝවේ දර්ශනයට දායක වීම.

කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

4. කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය විය යුත්තේ:-

(අ) සියලු යුනෙස්කෝ පද්ධති සහ ක්‍රියාකාරකම් සමඟ ජාත්‍යන්තර සම්බන්ධතාවය, සම්බන්ධීකරණය, උපදේශනය සහ සහයෝගීතාව වර්ධනය කිරීම සහ තහවුරු කිරීම;

(ආ) යුනෙස්කෝ මහ සමුළුව, විධායක මණ්ඩල රැස්වීම්, දායක සමුළු, සාකච්ඡා සහ අන්තර් රාජ්‍ය සමුළුවල දී ශ්‍රී ලංකාව විසින් සුදුසු නියෝජනයන් සහතික කිරීම සහ දැනුවත් කළ මැදිහත්වීම් සඳහා පහසුකම් සැලැස්වීම;

(ඇ) යුනෙස්කෝ සම්මුති, යෝජනා සම්මතයන් සහ එවැනි සමාන සාධන පත්‍ර පරදූ දරන්නන්ට දැනුම් දීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඈ) ශ්‍රී ලංකාවේ පරදූ දරන්නන් සමඟ සහයෝගීතාවයෙන් යුතු ව සහ යුනෙස්කෝ පද්ධතිය මගින් තාක්ෂණික සහාය සහ හැකියා වර්ධනය ආධාර කරගෙන ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ ආශ්‍රිත වැඩසටහන්, මධ්‍යස්ථාන, ස්ථාන, නගර, මඩුලු, සංගම්, සමාජ සහ මූලාසන ආරම්භ කිරීම, අරමුදල් සැපයීම, සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම;

(ඉ) කොමිෂන් සභාවේ කටයුතුවලට සහාය දැක්වීම සඳහා නිශ්චිත කොන්දේසි සහිතව යුනෙස්කෝ නිපුණතා ඇති ක්ෂේත්‍රවල ජාතික කමිටු, මෙහෙයුම් කමිටු, ක්‍රියාකාරී කමිටු, විද්වත් කමිටු සහ උපදේශකවරු පත්කිරීම සහ කමිටු සාමාජිකයන් සඳහා සුදුසු පාරිශ්‍රමික තීරණය කිරීම;

(ඊ) පරදූ දරන්නන් සමඟ ශ්‍රී ලංකාවට අදාළවන පරිදි යුනෙස්කෝව ප්‍රකාශයට පත් කළ දින, වර්ෂ සහ දශකයන් සැමරීම;ෟ

(උ) යුනෙස්කෝ ප්‍රදානයන්, සම්මාන සාමාජිකත්ව, යුනෙස්කෝ මූලාසන, අධ්‍යයන ප්‍රදානයන් සහ වෙනත් වැඩසටහන් සම්බන්ධයෙන් තොරතුරු ව්‍යාප්ත කිරීම සහ අයදුම්කරුවන් නිර්දේශ කිරීම;

(ඌ) මේ පනත යටතේ කොමිෂන් සභාවට එහි යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට අවශ්‍ය විය හැකි පරිදි සියලු කාරණාවලට අදාළ වන වාර්තා තොරතුරු සහ දත්ත රජය සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන ආයතන වෙතින් ලබා ගැනීම;

(එ) කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවකයන් ඉවත් කිරීම ඇතුළුව විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ඒ) යුනෙස්කෝ හි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන පරිදි කාර්යාල, පුස්තකාල, මණ්ඩප, රැස්වීම් ශාලා, සම්මන්ත්‍රණ ශාලා සහ යුනෙස්කෝ එලක ඇතුළුව යම් ගොඩනැගිලි සහ ස්මාරක ඉදිකිරීම, කුලී පදනම මත ලබා ගැනීම, සපයා ගැනීම සහ පවත්වාගෙන යාම;

(ඔ) කොමිෂන් සභාවේ කර්තව්‍යයන් කාර්යක්ෂමව කරගෙන යාමට සහ යුනෙස්කෝවේ ක්‍රියාකාරකම් සඳහා එහි සහභාගීත්වය වැඩි කිරීමට හැකිවන පරිදි මූල්‍ය කළමනාකරණයේ ප්‍රමාණවත් අධිකාරයක් ක්‍රියාත්මක කිරීම;

(ඕ) යුනෙස්කෝ නිල නියෝගයේ අදාළ කටයුතු සිදු කිරීමට අදාළ පරදු දරන්නන්ට බලය පැවරීම, අනුමත කිරීම සහ අවසර දීම;

(ක) මහලේකම් කාර්යාලයේ මෙහෙයුම් හැසිරවීමට සහ පහසුකම් සැලැස්වීමට මෙහෙයුම් අත්පොත්, මාර්ගෝපදේශ සහ නියෝග අනුමත කිරීම සහ නිකුත් කිරීම;

(ග) පොදු මහජනතාවට, පුද්ගලයන්ට සහ ආයතනවලට ලබාගත හැකි වන පරිදි යුනෙස්කෝවේ පරමාර්ථ, වැඩසටහන් සහ ක්‍රියාකාරකම්වල යම් අරමුණකට සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය සහ ඩිජිටල් මාධ්‍යවලට ව්‍යාප්ත කිරීම;

(ච) යුනෙස්කෝ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය (රජයේ හෝ පෞද්ගලික) අරමුදල් හෝ විදේශ අරමුදල් භාර ගැනීම සහ බලමුළු ගැන්වීම:

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් සියලු විදේශ අරමුදල් සම්බන්ධයෙන් විදේශීය සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතිය ලබා ගත යු තු ය;

(ඡ) යුනෙස්කෝ සහ යුනෙස්කෝ අනුබද්ධිත මණ්ඩලවලට ගෙවිය යුතු වාර්ෂික සාමාජික හෝ දායක මුදල් ගෙවීම;

(ට) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි යම් සියලු ගිවිසුම්වලට සහ අවබෝධතා ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ඉටු කිරීම සහ යුනෙස්කෝවට සම්බන්ධ කාරණා පිළිබඳ ඒකාබද්ධ හෝ ස්වාධීන අධ්‍යයන, පර්යේෂණ, සාකච්ඡා සහ උපදේශන පැවැත්වීම;

(ඩ) කොමිෂන් සභාවේ කාර්ය සහ කර්තව්‍ය බාධාවකින් තොරව සහ කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි පර්යේෂණ, දත්ත විශ්ලේෂණය කිරීම හෝ වෙනත් යම් සේවා හෝ ක්‍රියාවන්ට අදාළව මූල්‍ය නියෝගවලට අනුකූලව සුදුසු ගෙවීම් කිරීම සඳහා බැහැරින් මුදල් ලබා ගැනීම;

(ණ) මේ පනතේ කාර්ය සඳහා යම් තැනැත්තකු විසින් සිදුකළ සියලු පර්යේෂණවල, යම් ද්‍රව්‍යවල හෝ එකතු කළ දත්තවල අයිතිය දැරීම සහ ඒ පර්යේෂණ, ද්‍රව්‍ය හෝ දත්ත ආරක්ෂා කිරීම සඳහා වගකීම දැරීම;

(ත) යුනෙස්කෝ ක්‍රියාකාරකම් පරිපාලනය කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සහ යුනෙස්කෝ ලැයිස්තුගත ස්ථාන හා අයිතම සහ ක්‍රියාකාරකම් සඳහා යුනෙස්කෝ අනුමත ලාංඡනය භාවිතය සඳහා අවසර දීම සහ එම සේවාවන් සඳහා ගාස්තු අය කිරීම;

(ද) යම් බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතුරුම් සහ තැන්පතු හෝ ස්ථාවර ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සහ කොමිෂන් සභාවේ කාර්ය සඳහා ඉක්බිතිව ම අවශ්‍ය නොවන යම් අරමුදල් කොමිෂන් සභාව විසින් තීරණය කළ හැකි පරිදි යම් සුරැකුම්වල ආයෝජනය කිරීම;

(න) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා මුදලින් හෝ අන්‍යාකාරයකින් දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ත්‍යාග, දායක මුදල්, ප්‍රදාන හෝ පරිත්‍යාග පිළිගැනීම:

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින් සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විදේශීය සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ප) ශ්‍රී ලංකාව තුළ පෞරාණික ස්ථාන සහ ජෛවගෝලීය සංචිත සහ වෙනත් යුනෙස්කෝ ස්ථාන නැරඹීමට එන සෑම අමුත්තකු සඳහා ම මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් අනුපාතයකට ගණනය කළ බද්දක් පැනවීම;

(බ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම සහ දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට දීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීම; සහ

(ම) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි යම් සියලු ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ඉටු කිරීම.

**5.** කොමිෂන් සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය:- කොමිෂන් සභාවේ සංයුතිය

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්, එනම් -

(i) අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ රාජ්‍ය අමාත්‍යවරයා;

(ii) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iii) භාණ්ඩාගාර ලේකම්වරයා හෝ භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයකුට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(iv) විදේශ කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(v) වෘත්තීය පුහුණු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(vi) උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(vii) විද්‍යා හා තාක්ෂණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(viii) සාගර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(ix) පරිසර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(x) සංස්කෘතික විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(xi) ලේඛන උරුමය පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(xii) ජනමාධ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(xiii) සමාජ සේවා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ තනතුරට නොඅඩු තනතුරක් දරනු ලබන ඔහුගේ නාමිකයකු;

(xiv) යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාවේ මහලේකම්වරයා;

(xv) මේ පනත යටතේ පිහිටුවන ලද ජාතික කමිටු හයෙහි සභාපතිවරු හයදෙනා;

(ආ) මෙහි මින්මතු "පත් කළ සාමාජිකයන්'' යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යාපනය, ස්වාභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, සංස්කෘතිය සහ මාධ්‍ය සංනිවේදනය සහ තොරතුරු යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයක් ලබා ඇති තැනැත්තන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයන් හයදෙනෙකු.

කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා

**6.** (1) අමාත්‍යවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතු ය.

(2) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා කොමිෂන් සභාවේ උපසභාපතිවරයා විය යුතු ය.

(3) සභාපතිවරයා සහ උපසභාපතිවරයා, කොමිෂන් සභාව සඳහා පත් කිරීමට අදාළ වූ ධුරය දරනු ලබන තාක් කොමිෂන් සභාවේ ධුර දැරිය යුතු ය.

(4) රෝගාතුරවීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සභාපතිවරයාට

සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, උප සභාපතිවරයාට සිය ධුරයේ සාමාන්‍ය කාර්යන්ට අතිරේකව, සභාපතිවරයා වශයෙන් කටයුතු කළ හැකි ය.

**කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුසුකම්**

7. යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පලාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බංකොලොත් හෝ බුන්වත්භාවයට පත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්වන යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට නිශ්චය කොට ඇත්නම් හෝ සලකනු ලැබ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්;

(ඊ) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් සාදන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් දරයි නම් හෝ බුක්තිවිඳියි නම්;

(උ) කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී ඊට අගතිදායක වන ආකාරයකින් බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සබඳතාවක් ඇත්නම්; හෝ

(ඌ) කොමිෂන් සභාවේ අනුමතයකින් තොරව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණ සිට ඇත්නම්,

එම තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුස්සෙකු විය යුතු ය.

කොමිෂන් සභාවේ පත්කළ සාමාජිකයන්ගේ ධූර කාලය

**8.** කොමිෂන් සභාවේ සෑම පත්කළ සාමාජිකයකුම මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධූරය හිස් කළහොත් මිස, පත් කිරීමේ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධූර දැරිය යුතු අතර, ඔහු ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, තවදුරටත් වූ අනුගාමී හෝ අන්‍යාකාරයෙන් වන ධූර කාල එකක කාලසීමාවකට යටත්ව නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**9.** (1) කොමිෂන් සභාවේ ඕනෑම පත්කළ සාමාජිකයකුට, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම විටක දී ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් එම ඉල්ලා අස්වීම ලිඛිතව පිළිගනු ලැබීමෙන් පසුව එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයාට ඕනෑම පත්කළ සාමාජිකයකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කළ හැකි ය. ධූරයෙන් ඉවත් කරනු ලැබූ පත්කළ සාමාජිකයකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීමට හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් ධූරයක සේවය කිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

(3) මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා යම් පත්කළ සාමාජිකයකුගේ ධූරය හිස්වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 5(ආ) වගන්තියේ විධිවිධාන වලට යටත්ව, එම පුරප්පාඩු පිරවීම සඳහා වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු අතර, එම තැනැත්තා ඔහුගේ අනුගාමිකයාගේ ඉකුත් නොවී ඉතිරි වී ඇති ධූර කාලය සඳහා ධූර දැරිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් පත්කළ සාමාජිකයකුට, රෝගාතුරවීම හෝ වෙනත් යම් හේතුවක් හෝ මාස තුනකට නොඅඩු කාල සීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ඔහුගේ ධූරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන විටක, අමාත්‍යවරයා විසින් 5(ආ) වගන්තියේ විධිවිධානවලට යටත්ව ඔහු නොපැමිණි කාලය තුළ කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත්කළ යුතු ය.

(5) සිය නොපැමිණීම පිළිබඳව කොමිෂන් සභාව කලින් දැනුවත් කිරීමෙන් තොරව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී වීමට අපොහොසත් වන කොමිෂන් සභාවේ යම් පත්කළ සාමාජිකයකු, ධුරය හැරගියා සේ සැළකිය යුතු අතර, අමාත්‍යවරයා විසින් 5(ආ) වගන්තියේ විධිවිධානවලට යටත්ව එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත්කළ යුතු ය.

කොමිෂන් සභාවේ මහා සම්මේලනය

**10.** කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ පහත දැක්වෙන කාරණා සාකච්ඡා කර විසඳීම සඳහා සෑම වසරක ම මහා සම්මේලනය පවත්වනු ලැබිය යුතු ය.

(අ) යුනෙස්කෝ සංවිධානයේ සම්මුතීන්, ගිවිසුම් සහ ප්‍රධාන මූලාරම්භයන් සඳහා සහාය දැක්වීම, අත්සන් කිරීම, අපරානුමත කිරීම සහ සම්මත කරගැනීම ඇතුළු යුනෙස්කෝ සංවිධානයට අදාළ ක්‍රියාකාරකම්, රජය වෙත නිර්දේශ කිරීම;

(ආ) යුනෙස්කෝ සංවිධානයේ ප්‍රධාන වැඩසටහන් හා සමගාමීව ජාතික කොමිෂන් සභාවේ ක්‍රමෝපායන සැලසුම් නිර්දේශ කිරීම සහ අනුමත කිරීම;

(ඇ) ලේකම් කාර්යාලයේ ක්‍රියාකාරකම් සහ අයවැය නිර්දේශ කිරීම සහ අනුමත කිරීම සහ ජාතික කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සහ වාර්ෂික අයවැය අනුමත කිරීම;

(ඈ) වාර්ෂික වාර්තා සම්මත කිරීම සහ විගණකාධිපතිවරයාගේ වාර්තාව සඳහා වන ප්‍රතිචාර දැක්වීම;

(ඉ) ජාතික කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සහ ඇගයීම සහ ලේකම් කාර්යලයේ කාර්ය මණ්ඩලය සඳහා දිරිදීමනා නිර්දේශ කිරීම සහ අනුමත කිරීම;

(ඊ) අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි ජාතික කොමිෂන් සභාවේ මහලේකම්වරයා වෙත බලතල පැවරීම; සහ

(උ) ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යාපනික සහ විචාරාත්මක වාර්තා පිළිබඳ නිර්දේශ සිදු කිරීම.

ගණපූරණය සහ කොමිෂන් සභාවේ රැස්වීම්

11. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් දෙළොස්දෙනෙකු විය යුතු අතර, සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගනු ලබන එහි සාමාජිකයකු විසින් එම කොමිෂන් සභා රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමක් -

(අ) ඒ රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ ඊට සහභාගි වන ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන්ට ඊට සහභාගි වන සෑම සාමාජිකයකු ම එකවර දැක සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මගින්; හෝ

(ඇ) (අ) සහ (ආ) යන අවස්ථා දෙකම ඒකාබද්ධව,

පවත්වනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා ඇති සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද ප්‍රමාණය සමාන වන අවස්ථාවක දී එම රැස්වීමේ සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) කොමිෂන් සභාව අවම වශයෙන් වර්ෂයකට එක් වරක්වත් රැස්විය යුතු ය. එසේ වුව ද, කොමිෂන් සභාවේ සභාපතිවරයාට අවශ්‍ය වුවහොත් විශේෂ හෝ අතිවිශේෂ මහසභා රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

**කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව මත අවලංගු වන ලෙස නොසැලකිය යුතු බව**

**12.** කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම නොතකා කොමිෂන් සභාවට කටයුතු කළ හැකි අතර, එවැනි පුරප්පාඩුවක් හෝ පත්වීමේ දෝෂයක් පැවතීම නිසාම පමණක් එහි යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

**කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික**

**13.** මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයක් මත කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

**කොමිෂන් සභාවේ මුද්‍රාව**

**14.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව -

(අ) කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) කොමිෂන් සභාවේ අවසරය ඇතිව එහි සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට අත්සන නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කළ යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

**කමිටු පත් කිරීම**

**15.** (1) මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පවරා ඇති, නියම කර ඇති හෝ පනවා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඊට සහාය වීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන පරිදි හෝ අවස්ථානුකූල පරිදි, මහලේකම්වරයාගේ නිර්දේශය මත යම් ජාතික කමිටු සහ ප්‍රවීනයන් හා උපදේශකවරුන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන ජාතික කමිටු පහත දැක්වෙන පරිදි විය යුතු යः-

(අ) අධ්‍යාපන සඳහා වන යුනෙස්කෝ ජාතික කමිටුව;

(ආ) ස්වභාවික විද්‍යාව සඳහා වන යුනෙස්කෝ ජාතික කමිටුව;

(ඇ) සමාජ සහ මානව විද්‍යාව සඳහා වන යුනෙස්කෝ ජාතික කමිටුව;

(ඈ) සංස්කෘතික කටයුතු සඳහා වන යුනෙස්කෝ ජාතික කමිටුව;

(ඉ) සන්නිවේදන සහ තොරතුරු සඳහා වන යුනෙස්කෝ ජාතික කමිටුව; සහ

(ඊ) (යුනෙස්කෝහි ප්‍රවීනතා ක්ෂේත්‍රයන් තුළට ගැනෙන) යුනෙස්කෝ අන්තර් ආංශික ජාතික කමිටුව.

(3) කොමිෂන් සභාවේ මහලේකම්වරයාගේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් පත් කරන ලද එක් එක් ජාතික කමිටුව සඳහා සභාපතිවරයකු හෝ සම සභාපතිවරුන් සිටිය යුත්තේ ය.

(4) (2) වන උපවගන්තිය යටතේ පත්කරන ලද ජාතික කමිටු සාමාජිකයන්ට ඒ අදාළ ජාතික කමිටුවේ යොමුගත කරුණු ඵලදායීව ආමන්ත්‍රණය කිරීම සඳහා, එම ජාතික කමිටුවලට අදාළ විශේෂිත ක්ෂේත්‍රයන්හි යම් සුදුසුකම් සහ අත්දැකීම් තිබිය යුතු ය.

(5) ජාතික කමිටුවක සෑම සාමාජිකයකු විසින් ම, එකී සාමාජිකයාගේ නිල කාලය ඉකුත් වීමට පෙර මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම මත ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, ඔහුගේ පත්වීමේ දින සිට වසර තුනක කාලසීමාවක් දක්වා ධුරය දරනු ලැබිය යුතු අතර, ධුරයෙන් ඉවත් කළහොත් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයකින් තවදුරටත් වූ එක් කාලසීමාවකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

(6) ජාතික කමිටුවක යම් සාමාජිකයකු මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් ධුරය හිස්වන අවස්ථාවක දී, කොමිෂන් සභාව විසින් මහලේකම්වරයාගේ නිර්දේශය මත එකී පුරප්පාඩුව

පිරවීමට වෙනත් තැනැත්තකු පත් කළ යුතු අතර, ඒ තැනැත්තා විසින් ඔහු අනුප්‍රාප්ත වන්නා වූ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

(7) යම් ජාතික කමිටුවක සාමාජිකයකු අසනීප තත්වයක් හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක හෝ ඔහු මාස තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින්නේ නම් කොමිෂන් සභාව විසින් මහලේකම්වරයාගේ නිර්දේශය මත ඒ සාමාජිකයා වෙනුවට ඔහුගේ නොපැමිණීමේ කාලසීමාවේ දී කටයුතු කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(8) ජාතික කමිටුවක යම් සාමාජිකයකු විසින් ඔහුගේ නොපැමිණීම කලින් කොමිෂන් සභාවට නොදන්වා, ජාතික කමිටුවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගීවීමට අපොහොසත් වන අවස්ථාවක දී, එකී සාමාජිකයා ඔහුගේ ධුරය හිස්කරනු ලැබ ඇති බවට සලකනු ලැබිය යුතු අතර මහලේකම්වරයාගේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් එකී පුරප්පාඩුව පිරවීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(9) (2) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සෑම ජාතික කමිටුවකම සාමාජිකයන් සඳහා මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් දීමනාවක් ගෙවනු ලැබිය යුතු අතර, පවරන ලද කාර්ය ඉටු කිරීමේ දී දැරීමට සිදුවන යම් වියදම් ද ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

ජාතික කමිටුවල කාර්ය සහ කර්තව්‍ය

**16.** 15 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික කමිටුවල කාර්ය සහ කර්තව්‍ය විය යුත්තේ -

(අ) කොමිෂන් සභාවේ කටයුතු ඵලදායිව ක්‍රියාත්මක කිරීමට කොමිෂන් සභාවට උපදෙස් ලබාදීම සහ සහාය වීම සහ යුනෙස්කෝවේ නිපුණතා ක්ෂේත්‍රයන්ට අදාළ යම් ගැටලුවලට විසඳුම් සෙවීම;

(ආ) යුනෙස්කෝහි මහා සම්මේලනය වෙත සහ විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ජාතික ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර යුනෙස්කෝහි මූලාරම්භයන් පිහිටුවීම සහ

ක්‍රියාත්මක කිරීම, සම්මුතීන්, වැඩසටහන් සහ අයිතම පිළිබඳ අධ්‍යයනය කිරීම, සාකච්ඡා කිරීම, විසඳීම සහ නිර්දේශ සිදු කිරීම;

(ඈ) යුනෙස්කෝවේ උපාය මාර්ගික ක්ෂේත්‍ර වැඩසටහන් සහ ලේඛණ මගින් කොමිෂන් සභාවේ අදාළ ක්ෂේත්‍රවල වැඩසටහන් සහ ව්‍යාපෘති සංවර්ධනය කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ අධීක්ෂණය කිරීමට මහලේකම්වරයාට සහාය වීම;

(ඇ) ජාතික කමිටුවක් විසින් ආවරණය කළ යුතු එක් එක් විශේෂිත ක්ෂේත්‍රවල වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සහ අයවැය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

(ඉ) මහලේකම්වරයාගේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යුනෙස්කෝ ක්‍රියාකාරකම්වල දී සහාය දැක්වීම සඳහා වෙනත් යම් ක්‍රියාකාරකම් සිදු කිරීම.

තත්කාර්ය කමිටු පත් කිරීම

**17.** කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබිය හැකි පරිදි නිශ්චිත කාර්ය සඳහා යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය සහිත කොමිෂන් සභාවේ යම් සාමාජිකයන් සංඛ්‍යාවක් හෝ වෙනත් තැනැත්තන් හෝ ඒ දෙපාර්ශ්වයම ඇතුළත් කරමින් තත්කාර්ය කමිටු පත් කරනු ලැබිය හැකි ය.

## II වන කොටස

### මහලේකම් කාර්යාලය පිහිටුවීම සහ කොමිෂන් සභාවේ මහලේකම්වරයා, නියෝජ්‍ය මහලේකම්වරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

කොමිෂන් සභාවේ මහලේකම් කාර්යාලය පිහිටුවීම

**18.** (1) කොමිෂන් සභාවේ සියලු තීරණ, විධාන, මෙහෙයුම් සහ මුදල් පිළිබඳ සියලු වගකීම් ක්‍රියාවට නැංවීමට සහ මේ පනතට අදාළ සියලු තීරණ ක්‍රියාත්මක කිරීමට සහ මේ පනතට අදාළ සියලු කටයුතු ආරම්භ කිරීමට, සහාය වීමට, ක්‍රියාත්මක කිරීමට, කළමනාකරණය කිරීමට, අධීක්ෂණය කිරීමට සහ ඇගයීමට තනිව හෝ වෙනත් මණ්ඩල සමඟ සහයෝගයෙන් වගකීම භාර ගැනීම සඳහා (මෙහි මින්මතු "මහලේකම් කාර්යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහලේකම් කාර්යාලයක් පිහිටුවනු ලැබ තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් ලිඛිතව නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් කොන්දේසිවලට යටත් ව 4 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය 19 වන වගන්තිය යටතේ පත් කරනු ලැබ ඇති කොමිෂන් සභාවේ මහලේකම්වරයා වෙත පවරනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ මහලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ නාමයෙන් සහ ඒ වෙනුවෙන් එවැනි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) කොමිෂන් සභාව විසින් (2) වන උපවගන්තිය යටතේ සිදු කරන යම් පැවරීමක කුමක් සඳහන් වුව ද එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම එය විසින් ම සිදුකළ හැකි අතර ඕනෑම අවස්ථාවක එවැනි යම් පැවරීමක් ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ මහලේකම්වරයා පත් කිරීම

**19.** (1) අමාත්‍යවරයා විසින්, අධ්‍යාපනය, ස්වභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, සංස්කෘතිය, සන්නිවේදනය සහ තොරතුරු හෝ ජාත්‍යන්තර සබඳතා යන ක්ෂේත්‍රයන්හි වසර විස්සකට නොඅඩු අධ්‍යාපන හෝ වෘත්තීමය පළපුරුද්ද සහිත තැනැත්තකු (මෙහි මින්මතු "මහලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාවේ මහලේකම්වරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) මහලේකම්වරයා, කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර,

(අ) මහලේකම් කාර්යාලයේ සමස්ථ ව්‍යුහය සහ මෙහෙයුම් ක්‍රමෝපායන දැක්මක් සහිතව ඉදිරිපත් කිරීම සහ මගපෙන්වීම සහ මෙහෙයවීම;

(ආ) කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබ ඇති පරිදි වූ සේවක තනතුරු සඳහා කාර්ය මණ්ඩලය පත් කිරීම සහ කළමනාකරණය කිරීම;

(ඇ) මහලේකම් කාර්යාලයේ ක්‍රියාකාරකම් සහ පැවරුම්වලට සහාය දැක්වීම සඳහා වූ නිශ්චිත කොන්දේසි සහිතව යුනෙස්කෝ නිපුණතා ඇති ක්ෂේත්‍රවල ජාතික කමිටු, තත්කාර්ය කමිටු සහ යුනෙස්කෝ නිපුණතා ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් සහ උපදේශකවරුන් පත් කිරීම සහ කමිටු

සාමාජිකයන්, ප්‍රවීණයන් සහ උපදේශකවරුන් සඳහා වූ සුදුසු පාරිශ්‍රමිකයන් පිළිබඳව කොමිෂන් සභාව වෙත නිර්දේශ කිරීම;

(ඈ) කොමිෂන් සභාවේ මෙහෙයුම්, පරිපාලන සහ මූල්‍ය කළමනාකරණය;

(ඉ) 1999 අංක 44 දරන යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල පනත යටතේ පිහිටුවන ලද යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල පරිපාලනය කිරීම;

(ඊ) යුනෙස්කෝහි වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සමග පවරනු ලැබ ඇති කොමිෂන් සභාවේ වාර්ෂික වැඩසටහනට අනුකූලව සකසන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය ඉදිරිපත් කිරීම;

(උ) කොමිෂන් සභාවේ සහ මහලේකම් කාර්යාලයේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට කාර්යපටිපාටි අත්පොත සහ කලින් කලට අවශ්‍ය සංශෝධන සැකසීම;

(ඌ) කොමිෂන් සභාවේ අරමුදල කළමනාකරණය කිරීම; සහ

(එ) කොමිෂන් සභාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම,

ඇතුළුව, ලේකම් කාර්යාලය හරහා කොමිෂන් සභාව වෙනුවෙන් සියලු ම මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකියනු ලැබිය යුතු ය.

(3) මහලේකම්වරයා, කොමිෂන් සභාවේ හෝ මේ පනත යටතේ පිහිටුවනු ලැබ ඇති වෙනත් යම් කමිටුවක යම් රැස්වීමකට සහභාගී වීමට සහ කතා කිරීමට හිමිකම් ලැබිය යුතු ය.

(4) මහලේකම්වරයා විසින්-

(අ) වගකීම් බාධාවකින් තොරව ඉටු කිරීම සඳහා යෝග්‍ය යයි පෙනෙන පරිදි, මහලේකම්වරයාගේ යම් කර්තව්‍ය නියෝජ්‍ය මහලේකම්වරයා වෙත හෝ මහලේකම් කාර්යාලයේ වෙනත් යම් නිලධරයකු වෙත පැවරීම;

(ආ) කොමිෂන් සභාවේ අනුමතය සහිතව, කාර්ය සහ කර්තව්‍ය සිදු කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ එකී අයිතිවාසිකම්, වරප්‍රසාද, බලතල, බලපත්‍ර සහ අධිකාරීන් අත්කරගැනීම සහ ඒ සඳහා බලය ලබා දීම;

(ඇ) සහයෝගීතා ක්‍රියාකාරකම් සහ තාක්ෂණික නිලධරයන් හුවමාරු කර ගැනීම සඳහා, කොමිෂන් සභාවේ අනුමතය සහිතව, යුනෙස්කෝ සංවිධානයේ සහ කොමිෂන් සභාවේ පරමාර්ථවලට පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් සමාන පරමාර්ථ ඇති, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ආයතන සමග ගිවිසුම්වලට එළඹීම;

(ඈ) කොමිෂන් සභාවේ අනුමතය සහිතව සහ අදාළ කමිටු විමසා, රැස්වීම් සඳහා සහභාගී වීමට සුදුසු ප්‍රවීණයන් නම් කිරීම, සහාය දැක්වීම සහ අරමුදල් සැපයීම; සහ

(ඉ) යුනෙස්කෝ සංවිධානයේ ප්‍රමුඛතාවලට අදාළ විෂයන් පිළිබඳ වාර්තා, වාර සඟරා, අත්පොත් සහ පත්‍රිකා එක්රැස් කිරීම, මුද්‍රණය කිරීම සහ ප්‍රකාශනය කිරීම,

සිදු කළ හැකි ය.

(5) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයකින් මහලේකම්වරයා වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ නියෝජ්‍ය මහලේකම්වරයා පත් කිරීම

**20.** (1) අමාත්‍යවරයා විසින් (මේ පනතේ "නියෝජ්‍ය මහලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යාපනය, ස්වභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, සංස්කෘතිය, සන්නිවේදනය හෝ පරිපාලනය හෝ මුදල් යන ක්ෂේත්‍රවල අවුරුදු පහළොවකට වඩා නොඅඩු ශාස්ත්‍රීය හෝ වෘත්තීමය පළපුරුද්දක් ඇති තැනැත්තකු කොමිෂන් සභාවේ නියෝජ්‍ය මහලේකම්වරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු ය.

(2) නියෝජ්‍ය මහලේකම්වරයා විසින් කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා මහලේකම්වරයාට සහාය විය යුතු අතර, මහලේකම්වරයා විසින් පවරන ලද කටයුතු කරගෙන යා යුතු ය.

(3) නියෝජ්‍ය මහලේකම්වරයා කොමිෂන් සභාවේ යුනෙස්කෝ මහා සමුළුවේ ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයකින් නියෝජ්‍ය මහලේකම්වරයා වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

මහලේකම්වරයාගේ සහ නියෝජ්‍ය මහලේකම්වරයාගේ ධුර කාලය

**21.** (1) මහලේකම්වරයා සහ නියෝජ්‍ය මහලේකම්වරයා අවුරුදු හතරක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර, අනුගාමී වන හෝ අන්‍යාකාරයකින් වන වැඩිදුරටත් වූ කාලසීමා එකකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි මහලේකම්වරයාට හෝ නියෝජ්‍ය මහලේකම්වරයාට ඔවුනට එරෙහිව ඉදිරිපත් කළ යම් චෝදනාවකට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් සලස්වා දීමෙන් පසු අමාත්‍යවරයා විසින් හේතු දක්වා මහලේකම්වරයා හෝ නියෝජ්‍ය ලේකම්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) මියයාම, ධුරයෙන් ඉවත් කිරීම හෝ අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීම මත මහලේකම්වරයාගේ සහ නියෝජ්‍ය මහලේකම්වරයාගේ ධුර පුරප්පාඩු වන්නේ ය.

(4) මහලේකම්වරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් පවතින්නේ නම්, ඒ තනතුරට පත්වීමක් සිදු කරන තෙක් මහලේකම්වයාගේ කාර්ය ඉටු කිරීමට අමාත්‍යවරයා විසින් නියෝජ්‍ය මහලේකම්වරයා පත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම

**22.** (1) කොමිෂන් සභාවේ එකඟත්වය සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අවසරය ඇතිව මහලේකම්වරයා විසින් එහි බලතල සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි බවට සලකන යම් නිලධාරීන් සහ සේවා නියුක්තිකයන් සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද එහි නිලධරයන් සහ සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ එවැනි නිලධරයන් සේවයෙන් ඉවත් කිරීම සහ එවැනි නිලධාරීන් සහ සේවා නියුක්තිකයන්ගේ සේවා නියුක්තියේ නියම සහ කොන්දේසි නිශ්චය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා කොමිෂන් සභාවේ නිලධරයන් සහ සේවා නියුක්තිකයන්ට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයකට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, මේ පනතේ විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් සේවා කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් රජයේ සේවයට පිටතින් කොමිෂන් සභාවට බඳවාගනු ලැබිය හැකි යම් නිලධාරීන් සහ සේවා නියුක්තිකයන්ගේ යහපත සඳහා අර්ථ සාධක අරමුදල් යෝජනා ක්‍රම පිහිටුවීම සහ නියාමනය කිරීම කළ හැකි අතර, එවැනි යම් යෝජනා ක්‍රම සඳහා දායකවිය හැකි ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවකයන් පත්කිරීම

**23.** (1) කොමිෂන් සභාවේ ඉල්ලීම මත සහ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත්කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයා සඳහා සහ එම නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**උසස් අධ්‍යාපන ආයතනවලින් කොමිෂන් සභාවට නිලධරයන් පත් කිරීම**

**24.** (1) කොමිෂන් සභාවේ ඉල්ලීම මත 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තිකයකු එම නිලධරයාගේ හෝ සේවා නියුක්තිකයාගේ සහ එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි අතර, එවැනි ම කැමැත්ත ඇතිව එම නිලධරයා හෝ සේවා නියුක්තිකයා කොමිෂන් සභාව සහ එම ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟවන විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළුව යම් නියම හා කොන්දේසි මත එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කිරීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන්නා වූ විනය පාලනයට ම යටත් විය යුතු ය.

## III වන කොටස

## මුදල්

**කොමිෂන් සභාවේ ප්‍රාග්ධනය**

**25.** (1) කොමිෂන් සභාවේ ආරම්භක ප්‍රාග්ධනය -

(අ) යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන මුදලක් විය යුතු ය; සහ

(ආ) විසර්ජන පනතක් මගින් හෝ පාර්ලිමේන්තුවේ යම් යෝජනා සම්මතයක් මගින් අනුමත කරන මුදල් ප්‍රමාණයකින් වැඩිකරනු ලැබිය හැකි ය.

**කොමිෂන් සභාවේ අරමුදල**

**26.** (1) කොමිෂන් සභාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ අරමුදල පහත දැක්වෙන මුදල්වලින් සමන්විත විය යුතු යː-

(අ) පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලුම මුදල්;

(ආ) ආයෝජන මත ලැබෙන පොලිය, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල්:

එසේ වුව ද, සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු අතර, ශ්‍රී ලංකාවේ යම් ප්‍රභවයකින් ලැබෙන ණය, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ සහ ප්‍රදාන ඒකාබද්ධ අරමුදලට බැර කර ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමතය ඇතිව කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය;

(ඇ) කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන ආයෝජන මත ලැබෙන සියලුම ආදායම් මුදල්;

(ඈ) ගාස්තු සහ දායක මුදල් ලෙස අයකරනු ලබන සියලු මුදල්.

(3) කොමිෂන් සභාවේ අරමුදලින් පහත දැක්වෙන මුදල් ගෙවිය යුතු ය:-

(අ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ පනත මගින් හෝ එය යටතේ අරමුදලින් ගෙවිය යුතු බවට නියම කර ඇති සියලු මුදල්.

කොමිෂන් සභාවේ මුදල් ආයෝජනය කිරීම

**27.** කොමිෂන් සභාවට අයත් යම් මුදලක් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා විසින් ලබාදෙනු ලබන යම් විධානවලට යටත්ව සුදුසු යයි තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් ආකාරයකින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය

**28.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත් තැබීමට කොමිෂන් සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය

අමාත්‍යවරයාගේ විධාන

**29.** (1) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් කලින් කල කොමිෂන් සභාව වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව ලබා දිය හැකි අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම කොමිෂන් සභාවේ කාර්යභාරය වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට, කොමිෂන් සභාවේ කටයුතු සියල්ල හෝ ඉන් යම් කටයුත්තක් විමර්ශනය කර ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබීමේ දී, එම නියමය බලාත්මක කිරීම සඳහා යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට අවශ්‍ය විය හැකි සියලු පහසුකම් කොමිෂන් සභාව විසින් ලබා දිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය තොරතුරු සියල්ල ඉදිරිපත් කළ යුතු ය.

කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව

**30.** සෑම මුදල් වර්ෂයක් ම අවසන්වීමෙන් පසු මාස හයක කාලයක් ඇතුළත අදාළ වර්ෂය තුළ සිදු වූ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ පූර්ණ වාර්තාවක් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින්, එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂය අවසන්වීමට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**31.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ එහි නිලධරයන් හා සේවා නියුක්තිකයින් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන අදාළ වන බව

**32.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ වන III වන කොටසේ I වන පරිච්ඡේදයේ, ''අල්ලස් හෝ දූෂණවලට අදාළ වැරදි'' යන ශීර්ෂය යටතේ වන විධිවිධාන මේ පනතේ විධිවිධාන සම්බන්ධයෙන් ඒ ආකාරයෙන්ම අදාළ වන බවට සැලකිය යුතු ය.

මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධාන යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව

**33.** (1) යම් අධිකරණයක් ඉදිරිපිට කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ලැබුණ හෝ අයකරගනු ලැබූ යම් ගාස්තුවක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියේ පවරා ඇති සිවිල් හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද වියදම් එම ක්‍රියාව සිදු කර ඇත්තේ සද්භාවයෙන් බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබුවහොත් හෝ එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් එම මුදල අයකර ගනු ලැබුවහොත් මිස, එකී මුදල් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

රීති

**34.** (1) කොමිෂන් සභාව විසින් -

(අ) නිලධරයන්ගේ පත් කිරීම, සේවා නියුක්තිය සහ සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ආ) කොමිෂන් සභාවේ රැස්වීම්, වාර්ෂික මහ සභා රැස්වීම් සහ විශේෂිත රැස්වීම් පැවැත්වීමේ දී සහ කැඳවීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) කොමිෂන් සභාවේ කටයුතුවල පරිපාලනය සහ කළමනාකරණය;

(ඈ) මේ පනත යටතේ රීති සෑදීම සඳහා නියම කර ඇති හෝ බලය ලබා දී ඇති සියලුම කාරණා,

සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(3) එසේ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබීමේ දින සිට මාස තුනක් ඇතුළත එය දැනගැනීම පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

නියෝග

**35.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යැයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එකී පළකරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක කාලසීමාවක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන යම් නියෝගයක, එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**36.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ, -

"ප්‍රවීණයකු" යන්නෙන්, යුනෙස්කෝ වැඩසටහන්වල කුමන හෝ ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් සහිත වෘත්තිකයකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"යුනෙස්කෝ" යන්නෙන්, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය අදහස් වේ;

"යුනෙස්කෝ පද්ධතිය" යන්නෙන්, යුනෙස්කෝ මූලස්ථාන, කලාපීය කාර්යාල, ක්ෂේත්‍ර කාර්යාල, ජාතික කාර්යාල, සම්බන්ධීකරණ කාර්යාල, කොමිෂන් සභා, ජාල, 1 වන ගණයේ සහ 2 වන ගණයේ මධ්‍යස්ථාන, යුනෙස්කෝ උරුම ස්ථාන, ජෛව ගෝලීය සංචිත, යුනෙස්කෝ නගර සහ යුනෙස්කෝ සමාජ, සමාගම් සහ ආසන සහ යුනෙස්කෝ යෝජනා සම්මත මගින් පද්ධතියට එක් කළ වෙනත් යම් එකතු කිරීම් අදහස් වේ;

"යුනෙස්කෝ ක්‍රියාකාරකම්" යන්නෙන්, යුනෙස්කෝ පද්ධතිය මගින් කරගෙන යනු ලබන වැඩසටහන්, ව්‍යාපෘති සහ වෙනත් සියලුම ක්‍රියාකාරකම් අදහස් වේ;

"කොමිෂන් සභාවේ පරදු දරන්නන්" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ නිපුණතා ක්ෂේත්‍රවල දී යුනෙස්කෝව හා සම්බන්ධ වී ඇති රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, සංස්ථාපිත මණ්ඩල, පුද්ගලික ආයතන, සංගම්, ජාත්‍යන්තර සංවිධාන, පුද්ගලයන් සහ බුද්ධිමතුන් අදහස් වේ;

"යුනෙස්කෝ නිපුණතා ක්ෂේත්‍ර" යන්නෙන් අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික, සමාජ සහ මානව විද්‍යා සහ සන්නිවේදන සහ තොරතුරු ක්ෂේත්‍ර අදහස් වේ;

"යුනෙස්කෝ වැඩසටහන්" යන්නෙන්, යුනෙස්කෝ නිපුණතා ක්ෂේත්‍ර අදහස් වන අතර අධ්‍යාපනය, ස්වභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, සංස්කෘතිය සහ සන්නිවේදනය සහ තොරතුරු ඊට ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**37.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.